# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි අංක : 02/2018

අංක 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

2018.12.17

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**<u>ශිෂ්‍යත්ව සහ බැඳුම්කර උල්ලංඝනය කිරීම්වල වටිනාකම් නැවත අය කර ගැනීම</u>**

2018 ඔක්තෝබර් 04 දින විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පැවති සිය 996 වන සභා වාරයේ දී දීර්ඝ කාලීනව නොගෙවූ බැඳුම්කර ලේඛනය සැලකිල්ලට ගනිමින්, විගණන කමිටුවේ සහ කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගැනීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයේ 5 වන පරිච්ඡේදයේ 7 වන ඡේදයේ සඳහන් වන විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් එම විධිවිධාන ක්‍රියාත්මක කිරීම පසු විපරම් කිරීමට අදාළ උසස් අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර විගණන නිලධාරියා වෙත පැවරීමටත් උසස් අධ්‍යාපන ආයතනවලට දැඩිව උපදෙස් ලබා දීමට.

II. උසස් අධ්‍යාපන ආයතන තුළ ශිෂ්‍යත්ව උල්ලංඝනය කරන්නන්ගෙන් නැවත එම මුදල් අයකර ගැනීම සමාලෝචනය කිරීමට කමිටු පිහිටු වීම සඳහා උසස් අධ්‍යාපන ආයතනවලට උපදෙස් ලබා දීමට.

III. විගණන කමිටුවට සිය නිර්දේශ පාලක සභාව වෙත ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි, අර්ධ වාර්ෂිකව උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රගතිය විශ්වවිද්‍යාලයේ විගණන කමිටුව වෙත ඉදිරිපත් කිරීමට උසස් අධ්‍යාපන ආයතනවල ආයතන අංශය වෙත උපදෙස් ලබා දීමට.

IV. උසස් අධ්‍යාපන ආයතනවල ශිෂ්‍යත්ව හා බැඳුම්කර සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන්ට, බලාත්මක කළ හැකි ශිෂ්‍යත්ව හා බැඳුම්කර ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි ඔවුන්ව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට.

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ.කළේ. මහාචාර්ය මොහාන් ද සිල්වා
සභාපති

(අ.පි.බ)

පිටපත් :

1. ලේකම්/ උසස් අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම්/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරුන්
8. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. ගණකාධිකාරී/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
10. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
11. විශ්වවිද්‍යාලවල/ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන්/සහකාර පුස්තකාලයාධිපතිවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරුන් / සහකාර ලේඛකාධිකාරීවරුන්
13. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
14. විශ්වවිද්‍යාලවල නියෝජ්‍ය අභ්‍යන්තර විගණකවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්/සහකාර අභ්‍යන්තර විගණකවරුන්
15. විගණකාධිපති
16. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
17. වෘත්තීය සමිති ලේකම්වරුන්

ලිපි ගොනු අංක: යූ.ජී.සී./සී.අයි.ඒ/එෆ්/අයි.ඒ චක්‍රලේඛ /1